**18-03-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** බොහෝ සුමිහිරි වූ, සේවයේ යෙදෙන දරුවනි, සේවයට බාධා පමුණුවන විදියේ ක්‍රියාවන් කරන්න එපා.

**ප්‍රශ්නය:** මේ සංගම් යුගයේදී දරුවන් වන ඔබ සම්පූර්ණ නිරවද්‍යතාවයට පත් විය යුතුය. නිවැරදි විය හැක්කේ කාටද?

**පිළිතුර:** 1. ඒ සත්‍ය වූ පියා සමඟ නිරන්තරයෙන්ම අවංකව සිටින දරුවන්ට නිවැරදි විය හැකියි. ඔබ ඇතුලතින් එක් දෙයකුත්, පිටතින් තවෙකකුත් ඇති කෙනෙක් නොවිය යුතුයි. 2. ශිව බාබාගේ දෙයට අමතරව වෙන කිසිවක නොයෙදෙන අය. 3. සෑම පියවරකදීම ශ්‍රීමත් අනුගමනය කරන සහ කිසිම වැරැද්දක් නොකරන අයට නිවැරදි විය හැකියි.

**ගීතය:** ඔබගේ ළදරු අවධියේ දවස් අමතක කරන්න එපා!

ඕම් ශාන්ති. සුමිහිරි වූ අධ්‍යාත්මික දරුවන් ගීතයේ වචන කිහිපයකට සවන් දුන්නා. ඒ අසීමිත වූ පියා දැන් ඔබගේ අසීමිත වූ සතුට නම් උරුමය ලබා දෙනවා යන විශ්වාසය දැන් ඔබ තුළ තිබෙනවා. අපි දැන් මෙහි පැමිණ එවන් වූ පියෙකුගේ දරුවන් බවට පත්ව සිටිනවා. ඉතින් අපි ඒ පියාගේ ශ්‍රීමත් පිළිපැදිය යුතුයි. එසේ නැතහොත් සිදුවන්නේ කුමක්ද? එක් මොහොතකදි ඔබ ඉතාමත් හොඳින් සිනහ වී අධිරාජ්‍යවරුන් හා අධිරාජ්‍යවරියන් බවට ඔබ පත්වෙනවා කියා කියනවා. නමුත් ඔබ ඔහුගේ අත අත්හළහොත් එවිට ඔබ සාමාන්‍ය සේවකයන් බවට පත් වෙනවා. අනිවාර්යෙන්ම ඔබ දිව්‍ය ලෝකයට යාවි. සෑම කෙනෙක්ම දිව්‍ය ලෝකයට යන්නේ නැහැ ස්වර්ණම යුගයට සහ රිදී යුගයට යාමට සිටින අය පමණයි මෙහි එන්නේ. ස්වර්ණම යුගය හා රිදී යුගය යන දෙකෙහිම එකතුව තමයි දිව්‍ය ලෝකය ලෙස හඳුන්වන්නේ. කොහොමනමුත්, ඒ නව ලෝකයට මුලින්ම එන අය විශාල සතුටක් අත්දකිනවා. ඒ අතරම ප්‍රමාද වී එන අය කිසිම දැනුමක් ගන්නේ නැහැ. දැනුම ලබාගන්නා අය ස්වර්ණම යුගයට හා රිදී යුගයට යනවා. අනෙක් සෑම කෙනෙක්ම එන්නේ රාවණ්ගේ රාජ්‍යයේයි ඔවුන් අත්දකින්නේ පුංචි සතුටක් පමණයි. ස්වර්ණම යුගය හා රිදී යුගයේ විශාල ලෙසින් සන්තෝෂය තිබෙනවා. මේ නිසා තමයි ඔබ පියාගෙන් ඔබගේ අසීමිත සතුට නම් උරුමය ලබා ගැනීමට උත්සාහ දැරිය යුත්තේ. ඉතාමත් හොඳ ප්‍රවෘත්ති ලියන්න. ඔබ මුද්‍රණය කරන කාඩ් වල ලියන්න ඒ අසීමිත වූත්, උසස්තම වූත් පියාගේ සුබ ආරංචිය වන්නේ මෙයයි. ප්‍රදර්ශන වලදී ඒ නව ලෝකය ස්ථාපිත වන්නේ කෙසේද යන්න ඔබ පෙන්නුම් කරනවා. මෙය ලොකු අකුරෙන් ඉතා පැහැදිලි ලෙස ලියන්න. අසීමිත වූ පියා, දැනුමේ සාගරය, පාරිශුද්ධකරු, විමුක්තිදායකයා, ගීතාවේ දෙවියන් වන ශිවා, බ්‍රහ්ම කුමාරයින් හා කුමරියන් මාර්ගයෙන් යකඩ යුග, සම්පූර්ණයෙන්ම පාපතර, දූෂිත, අපිරිසිඳු ලෝකය නැවත වතාවක් සම්පූර්ණයෙන් පාපයෙන් තොර, පවිත්‍ර හා උසස් ස්වර්ණම යුග ලෝකයක බවට පත් කරවනවා. පැමිණ මෙම සුබ ආරංචියට සවන් දී එය තේරුම් ගන්න. ඔබ ආණ්ඩුවටත් පවසා තිබෙනවා එන්න, පැමිණ තේරුම් ගන්න අප ඒ උසස් වූ, 100% ක් පවිත්‍ර, සාමයෙන් හා සතුටෙන් යුතු ස්වර්ණම යුග දිව්‍ය රාජ්‍යය නැවතත් ස්ථාපිත කරන්නේ කෙසේද සහ මෙම පාපකාරි ලෝකය විනාශ වීමට යන්නේ කෙසේද කියා. මේ ආකාරයෙන් එය ඉතා පැහැදිලි ලෙස ලියන්න. මිනිසුන්ට ඉතා පැහැදිලි ලෙස තේරුම් ගත හැකි ආකාරයකට එය කාඩ්වල ලියන්න. ප්‍රජාපිතා බ්‍රහ්ම කුමාරයින් හා කුමාරියන් උත්තරීතර පියා, උත්තරීතර ජීවය වන ශිවාගේ උපදෙස් අනුගමනය කරමින්, පහසු රාජයෝගාව හා පාරිශුද්ධත්වයේ බලය තුළින් තම ශරීරය, මනස හා ධනයෙන් නාටකයේ සැලැස්මට අනුව මීට ඉහත කල්පයේදි කළ ආකාරයෙන්ම භාරතය එතරම් උසස් හා පාරිශුද්ධ දේශයක් බවට පත් කරවන්නේ කෙසේද යන්න පැමිණ තේරුම් ගන්න. කාඩ්වල මෙය ඉතා පැහැදිලි ලෙස මුද්‍රණය කරන්න. එවිට ශිව බාබාගේ උපදෙස් පිළිපැදීමෙන්, ඔබ බී.කේ වරුන් ඒ රාමාගේ රජ්‍යය ස්ථාපිත කරන බව ඕනෑම කෙනෙකුට තේරුම් ගත හැකියි. මහත්මා ගාන්ධිගේ ආශාව මෙය වූවා. මේ සම්පූර්ණ ආරාධනා පත්‍රය පත්තරවලත් මුද්‍රණය කරන්න. ප්‍රජාපිතා බ්‍රහ්ම කුමාරයන් හා කුමාරියන් මේ සියලුම දේ කරන්නේ ඔවුන්ගේ ශරීරය, මනස හා ධනය මඟින් බව අනිවාර්යෙන්ම විස්තර කරන්න. මන්ද, එවිට මිනිසුන් කිසිම විටෙක ඔබ දාන හෝ ආධාර ඉල්ලා හිඟා කන්නේ නැත යන්න වටහා ගන්නා නිසයි. පිටස්තර ලෝකයේ සෑම කෙනෙක්ම ඉදිරියට යන්නේ ඔවුන්ට ලැබෙන ආධාර මතයි. මෙහිදී, ඔබ කියනවා බී.කේ වරුන් වන අපි සියලු දේ කරන්නේ අපේම ශරීරය, මනස හා ධනයෙනි. අපි අපේම රාජ්‍යය ලබා ගන්නා නිසා

ඊට වියදම් දැරීමට සිදු වේවි. උත්සාහයෙහි යෙදෙන අය උපත 21 ක් සඳහා වූ උරුමයක් ලබනවා. එය උසස් සහ ද්විත්ව ඔටුණු පැළඳි භාරත දේශයේ වැසියන්ගේ නවාතැනයි. ලක්ෂ්මී සහ නාරායන ඔටුණු යුගලයක් පැළඳි අයයි. අද වන විට කිසිම කෙනෙක් ළඟ ඔටුන්නක් නැහැ. මෙය ඉතාමත් පැහැදිලි ලෙස විස්තර විය යුතුයි. පියා කියනවා මේ ආකාරයෙන් ලියන්න. මන්ද, එවිට දුප්පත් මිනිසුන්ට වැටහේවි බී.කේ වරුන් කරන්නේ මොනවාද යන වග. වැදගත් මිනිසුන් මේ ගැන කතා කරන විට දිළිඳු අයටත් එය ඇසෙනවා. එසේ නොමැතිව දුප්පත් අයට කිසිම කෙනෙක් සවන් දෙන්නේ නැහැ. ධනවත් අයට ඉක්මනින් සවන් දෙනවා. ඔබ විශේෂයෙන්ම භාරතය දිව්‍ය ලෝකය බවට පත් කරවන බවත්, අනෙක් සෑම දෙනෙක්ම සාම දේශයට යැවෙන බවත් ඔවුන්ට ඔප්පු කර පෙන්වන්න. මේ අයුරින් විස්තර කරන්න මීට අවුරුදු 5000 කට පෙර භාරතය මෙලෙස දෙව්ලොව ලෙසින් තිබුණා. දැන් එය කලි යුගය වන අතර, එකල ස්වර්ණමය යුගය වූවා. අපට කියන්න ස්වර්ණම යුගයේ මිනිසුන් කොපමණ සිටිනවාද? දැන් එය කලි යුගයේ අවසානයයි. මෙය එම මාහැඟි මහාභාරත යුද්ධයමයි. වෙන කිසිම කාලයකදී එවන් යුද්ධයක් ඇතිවන්නේ නැහැ. තුන්වන ලෝක යුද්ධය ඇති වූයේ අවසානයේදීයි. ඔවුන් දිගින් දිගටම උත්සාහ කරනවා. නොකඩවාම ඔවුන් පරමාණු බෝම්බ නිපදවනවා. ඔවුන් කිසිම කෙනෙකුට සවන් දෙන්නේ නැහැ. ඔවුන් ඔවුන්ගේ විරුද්ධවාදියාට කියනවා ඔබ ළඟ තිබෙන සියලුම බෝම්බ සාගරයට දැමුවහොත්, අපි තවත් බෝම්බ නිපදවන්නේ නැහැ. ඔබ බෝම්බ ළඟ තබාගෙන තිබියදි අපි ඒවා නිෂ්පාදනය නොකර ඉන්නේ කෙසේද? කොහොමනමුත්, දරුවන්ට තේරෙනවා මේ ආකාරයෙන් තමයි මගේ ඉරණම නිර්මාණ වී ඇත්තේ කියා. ඔබ ඔවුන්ට කොතරම් උපදෙස් දුන්නත් ඔවුන් තේරුම් ගන්නේ නැහැ. විනාශය සිදුවූයේ නැතහොත්, ඔබ රාජ්‍යය පාලනය කරන්නේ කෙසේද? දරුවන් තුළ විශ්වාසය තිබෙනවා. සැක සහිත බුද්ධියක් තිබෙන අය බාබාව අත්හැර පසුව ද්‍රෝහීන් බවට පත්වෙනවා. පියා සතු වීමෙන් පසුව, දෝහියෙක් නොවන්න. ඔබ ශිව බාබාව සිහි කළ යුතුයි වෙනත් කිසිම දෙයක ලාභයක් නැහැ. සත්‍ය පියා සමඟ අවංක වන්න. ඔබගේ ඇතුලාන්තය එක් ආකාරයක්ද පිටතින් තවත් ආකාරයක් නම්, ඔබගේ තත්ත්වය පහත් වෙයි. ඔබ තමන්ටම පාඩුවක් සිදු කරගනීවි. ඔබට සෑම කල්පයකදීම උසස් තත්ත්වයක් හිමි කරගැනීමට නොහැකි වෙයි. ඒ නිසයි, ඔබ මෙකල බොහෝ නිවැරදි විය යුත්තේ. නොසැලකිලිමත් නොවන්න. ඔබට හැකි පමණින් ශ්‍රීමත් අනුගමනය කරන්න. අවසානයේදී නිරන්තර සිහිපත් කිරීමේ සිටීමට හැකි වෙයි. පියා හැර වෙනත් කිසිවෙක් සිහි නොවිය යුතුයි. මෙසේ සිහි කර තිබේ, අවසානයේදී කෙනෙක් ස්ත්‍රියක් සිහි කළොත්... ඔබ සිහි කරන්නේ ඔබට බැඳීමක් ඇති කෙනෙක්වයි. ඔබ වැඩියෙන් ප්‍රගතිය කරා යත්ම, ඔබ වඩාත් සමීපයට පැමිණෙත්ම, ඔබට දිගින් දිගටම වැඩියෙන් දර්ශන ලැබෙයි. ඔබ කෙබඳු ආකාරයේ ක්‍රියා සිදු කළාද කියා, බාබා ඔබට පෙන්වයි. මුල් දිනවලදිද ඔබට දර්ශන ලැබුණි. දඬුවම් විඳි අය, බොහෝ සේ වැලපුණා. ඔබට පෙන්වීම සඳහා, එම ජීවයන්ගේ පාපයන් සිය ගුණයකින් කපා දමනු ලැබුවා. ඒ නිසයි බාබාගේ සේවයට බාධා සිදුවන කුමන හෝ ආකාරයක ක්‍රියාවන් ඔබ සිදු නොකළ යුත්තේ. ඔබ බාබාගේ සේවයට එවන් ආකාරයේ බොහෝ බාධක නිර්මාණය කර, විශාල පාඩුවක් සිදු කළ අන්දම ගැන, අවසානයේද ඔබට සෑම දේකම දර්ශන ලැබෙනු ඇත. මෙය රකුසු සමාජයයි. බාධක ඇති කරන අය බොහෝ දඬුවම් අත්විඳියි. ශිව බාබාගේ අධිකරණය ඉතා විශාලයි. ඔහුගේ දකුණත වන ධර්මරාජ්ද මෙහි සිටියි. වෙනත් දඬුවම් සීමිතයි. මෙහි උපත් 21 කට පාඩුවක් සිදු වී, තත්ත්වයද විනාශ වෙයි. ඔබ යමක් ගැන දැන නොසිටි බව, කිසිවෙකුට පැවසීමට නොහැකි වන පරිදි, පියා දිගටම සෑම දෙයක්ම විස්තර කර දෙයි. එබැවින් බාබා සෑම දෙයක් පිළිබඳවම ඔබට දිගටම අනතුරු අඟවයි. සෑම මධ්‍යස්ථානයකින්ම කී දෙනෙක් පැන ගොස් ඇතිද කියා ඔහු බලයි. ඔවුන් දූෂිත වී, කරදර සිදු කරයි. කෙනෙක් පාසැලේ සම්පූර්ණයෙන් ඉගෙන ගත යුතුයි. එසේ නැත්නම් ඔබ කුමන තත්ත්වයක් හිමි කර ගනීද? තත්ත්වයේ බොහෝ වෙනසක් ඇත. මෙම දුක් දේශයේ, එක් පුදගලයෙක් ජනාධිපතිවරයෙක්, තවත් කෙනෙක් ධනවත් කෙනෙක්, තවත් අයෙක් දුගියෙක් වන ආකාරයෙන්ම, ස්වර්ණමය යුගයේද තත්ත්වය අංකානුරූප වෙයි. රාජකීය, නුවණැති දරුවන් පියාගෙන් තම සම්පූර්ණ උරුමයම හිමි කරගැනීමට උත්සාහ දරයි. මායා සමඟ මල්ලව පොරයක් ඇත. මායා බොහෝ බලවත් වන අතර, දිගින් දිගටම ජය සහ පරාජය ඇති වෙයි. බොහෝ දෙනෙක් පැමිණ, ඉන්පසුව පිටව ගොස්, දෝහීන් වනවා. ඉදිරියට යන අතරේ ඔවුන් පරාජයට පත් වනවා. මෙය කළ හැක්කේ කෙසේද කියා බොහෝ දෙනෙක් අසනවා. නිවසේ ජීවත්ව ඉන්නා අතර පාරිශුද්ධව සිටිය හැකිය යන්න ඔවුන් කවදාකවත් අසා නැහැ. ඔහෝ! නමුත්, දෙවියන්ගේ වදනින් පවසන්නේ ලොකුම සතුරා රාගයයි! මෙයත් ගීතාවේ සඳහන්ව තිබෙනවා. එහි දෙවියන්ගේ නම වෙනුවට ක්‍රිෂ්ණාගේ නම සඳහන් කර තිබෙනවා. ක්‍රිෂ්ණාව දේවතාවක් ලෙසින්වත් හැඳින්විය නොහැකියි. එය දෙවි දේවතා ධර්මයයි. සූක්ෂම කලාපයේ නේවාසිකයන් පමණයි දේවතාවන් වශයෙන් හඳුන්වන්නේ. අන්

සියල්ලන්ම දිව්‍යමය ගුණධර්ම වලින් යුතු මිනිසුන්ය. ස්වර්ණම යුගයේ සිටින අය දිව්‍යමය ගුණධර්ම වලින් යුතු අයයි. නමුත් කලි යුගයේ සිටින්නේ යක්ෂ ගතිගුණ ඇති අයයි. යක්ෂ ගතිගුණ ඇති අය, දිව්‍යමය ගුණ ඇති අයව වර්ණනාවට ලක්කරනවා. එහිදී බොහෝ වෙනසක් තිබෙනවා! තමන් සිටින්නේ කුමන තත්ත්වයේද සහ පත්වන්න යන්නේ කුමන තත්ත්වයටද කියා දැන් ඔබට වැටහෙනවා. ඔබ, සියලුම ගුණධර්ම මෙහිදී උකහාගත යුතුයි. ඔබගේ කෑම බීම පවා සම්පූර්ණයෙන්ම පවිත්‍ර විය යුතුයි. බලන්න ඔවුන් දේවතාවන්ට පූජාකරන්නේ මොනවාද කියා! ශ්‍රී නාථ දේවාලයට ගොස් බලන්න ඔවුන් ඉතා ලොකු පිරිසිඳුකමකින් යුතුව ඉතාමත් ඉහළ ගණයේ ආහාර සාදන්නේ කෙසේද කියා. එහි සිටින්නේ වයිෂ්නවයින්ය. කොහොමනමුත්, ජගත්නාථ දේවාලයේ ඔවුන් මොනවාද පූජාකරන්නේ කියා බලන්න! බත්. එහි තිබෙන්නේ පාප මාර්ගයේ ඇති ඉතාමත් අපිරිසිදු පිළිමයි. එය ඔවුන්ගේ අධිරාජ්‍යය වශයෙන් පැවති කළ කෑම වර්ග 36 ක් තිබුණා. ශ්‍රී නාථ දේවාලයේ කෑම වර්ග රාශියක් සාදනවා. ජගත්නාථ ශ්‍රී නාථ වලට වඩා වෙනස්. ජගත්නාථ හී තිබෙන්නේ දේවතා ඇඳුම් වලින් සැරසුනු අපිරිසිදු පිළිමයි. එමනිසා, එහි සාදන කෑමත් එතරම් හොඳ නැහැ. ගිතෙල් නොදා නිකම්ම සාමාන්‍ය බතක් පමණයි ඔවුන් සූදානම් කරන්නේ. භාරතය තිබුණේ කෙසේද, දැන් එය පත්ව ඇත්තේ කිනම් තත්ත්වයකටද යන්න මින් හොඳින් පැහැදිලිව පෙන්නුම් වෙනවා. එහි දැන් තත්ත්වය දෙස බලන්න! හරියට කන්නවත් නැහැ! ඔවුන්ගේ සැලසුමත්, ශිව බාබාගේ සැලසුමත් අතර දහවල සහ රැය මෙන් වෙනසක් තිබෙනවා. ඔවුන්ගේ සැලසුම් සියල්ලම දූහුවිල්ලක් බවට පත් වෙනවා. ස්වභාවික ව්‍යසන පවා සිදු වේවි. ධාන්‍ය වර්ග කිසිම එකක් ඉතිරිවන්නේ නැහැ. ඇතැම් තැන්වල අධික වර්ෂාව තිබෙන අතර, තවත් තැනක වැස්සක් ඇත්තේම නැහැ. මින් ලොකු විනාශයක් සිදු වෙනවා. මේ මොහොතේ පංච මහා භූතයන් පවා තමෝප්‍රධාන්ව අපිරිසිදුව පවතින නිසා අකල් වැසි පවා ඇති වෙනවා. කුණාටු පවා තමෝප්‍රධාන් හිරු රශ්මිය පවා ඉතාමත් අධිකයි, ඒ ගැන අහන්නවත් එපා. මෙම ස්වභාවික ව්‍යසන නාටකයේ තීරණය වී තිබෙන දේවල්. විනාශය සිදුවන මොහොතේදී ඔවුන් තුළ කිසිම සෙනෙහසක් නැහැ. ඔබගේ බුද්ධිය පියා කෙරෙහි වූ සෙනෙහසින් යුතුව තිබෙනවා. අවිද්‍යා මාර්ගයේ දෙමාපියන් තමාගේ වටිනා දරුවන්ට වඩාත් ආදරෙයි. අන්න ඒ නිසා තමයි බාබා කියන්නේ ඔබ දරණ උත්සාහයේ හැටියට, අංක පිළිවෙලටයි බාබා ආදරයෙන් සිහිපත් කරන්නේ! වැඩි වැඩියෙන් සේවය කළ තරමට... ඔබට සේවය කිරීමට තිබෙනවා. පොදුවේ ගත් කල ලෝකයේත්, විශේෂයෙන්ම භාරතය තුළත් සේවය කළ යුතුයි. භාරතය දෙව්ලොව බවට පත් කළ යුතුයි. අන් සියලු දෙනාවම නැවත සාමයේ දේශය වෙත යැවිය යුතුයි. භාරතය දෙව්ලොවෙහි උරුමය දිනා ගන්නා අතර, ඉතිරි අය මුක්තියේ උරුමය ලබා ගන්නවා. සියලු දෙනාම ආපසු යනු ඇත. වේදනාවේ කඳුළු වලට පසුව ජයග්‍රහණයේ කඳුළු ගලනු ඇත. සෑම තැනම කලබල රාශියක් පවතීවි! කිසිම හේතුවකින් තොරව ලේ ගැලීම් ඇතිවීම සම්බන්ධව වූ නාටකයකි මෙය. ස්වභාවික ව්‍යසනයන් සිදුවේවි. සියලු දෙනාම මිය යා යුතුයි. දරුවනි, පරමාත්ම පියා කියනවා සම්පූර්ණ උත්සාහය දරන්න. පියාට නිරතුරුව කීකරුව හා විශ්වාසවන්තව සිටින්න! සේවය කළ හැකි අය බවට පත්වන්න. මීට පෙර කල්පයේ එවන් සේවයක් කළ අයට දර්ශන ලැබේවි. සියලු දේම ඔබ නොබැඳි නිරීක්ෂකයෙක් ලෙස දකීවි. ඔබ ස්වදර්ශන චක්‍රධාරීන් බවට පත්ව තිබෙනවා. ස්වදර්ශන චක්‍රය නිරන්තරයෙන්ම ඔබගේ බුද්ධිය තුළ කරකැවිය යුතුයි. මේ ආකාරයෙන් අපි උපත් 84 ක් ලබා තිබෙනවා. අපි දැන් නැවත නිවස බලා යා යුතුයි. පියාවත්, නිවසත් සිහිපත් කළ යුතුය. ස්වර්ණම යුගය ද සිහිපත් කළ යුතුයි. දවස පුරාම මේ සියල්ල ගැන සිහි කිරීමට ඔබේ බුද්ධිය යොදවන්න. අපි දැන් ලොවෙහි උසස් රාජ කමාරයින් බවට පත්වීමට නියමිතයි. අපි ශ්‍රී ලක්ෂ්මි හෝ ශ්‍රී නාරායන බවට පත්වනු ඇත. මෙම කුල්මත්භාවය තිබිය යුතුයි. බාබාට මෙම කුල්මත්භාවය තිබෙනවා. බාබා සෑම දිනකම මෙම පින්තූරය (ලක්ෂ්මි නාරායන පින්තූරය) දෙස බලනවා. ඇතුලාන්තයෙන් ඔහු තුළ මේ සතුට තිබෙනවා හෙට මම ශ්‍රී ක්‍රිෂ්ණා වෙමි. විවාහයෙන් පසු ඔහු ශ්‍රී නාරායන බවට පත්වනු ඇත. ඔබටත් එයම අදාලයි. ඔබත් ඒ තත්ත්වයට පත්වේවි නේද? මෙය රාජයෝගාවයි එය පුරවැසියෙක් බවට පත්වීමට ඇති යෝගාවක් නොවෙයි (ප්‍රජා යෝගා). ජීවාත්මයන් වන ඔබ නැවත වතාවක් තමන්ගේ රාජධානියේ වාසනාව හිමිකර ගන්නවා. ඔය දරුවන් තම රාජධානිය අහිමි කර ගත්තා. දැන් නැවත වතාවක් ඔබ රාජධානිය හිමිකර ගන්නවා. දකින විට බලා සතුටු වීම සඳහා බාබා මෙම පින්තූරය නිර්මාණය කර තිබෙනවා. අපි උපත් 21 ක දෙව්ලොව රාජධානිය නම් වූ වාසනාව උදාකර ගන්නවා. එය ඉතාමත් පහසුයි! මේ බ්‍රහ්ම බාබා මඟින් ශිව බාබා අපට රාජයෝගා උගන්වනවා. පසුව අපි මෙම තත්ත්වයට පත්වෙනවා. පින්තූරය දුටු සැනකින්ම ඔබගේ සතුටෙහි රසදිය කඳ ඉහළ නඟිනවා. පරමාත්ම පියා සිහිපත් කිරීමෙන් අපි ලෝකයේ රාජ කුමාරයන් බවට පත්වෙනවා. ලොකු සතුටක් තිබිය යුතුයි. මම ඉගෙන ගන්නවා, ඒ සමඟම ඔබත් ඉගෙන ගන්නවා. මෙම ඉගෙනීමෙන් පසු අපි ඒ තත්ත්වයට පත්වෙනවා. සියල්ල රඳාපවතින්නේ ඔබේ ඉගෙනීම කෙබඳුද යන්න

මතයි වැඩි වැඩියෙන් ඉගෙන ගත් තරමට ඔබගේ ආදායම වැඩි වේවි. ඇතැම් ශල්‍යවෛද්‍යවරුන් ඉතාමත් දක්ෂ බව බාබා ඔබට පවසා තිබෙනවා. ඔවුන් එක් ශල්‍යකර්මයකින් රුපියල් සිය දහස් ගණනක ආදායමක් උපයා ගන්නවා. නීතීඥයින් සම්බන්ධයෙන් ගත්තත් එසේමයි. ඇතැම් අය ඉතාමත් හොඳ ආදායමක් ලබනවා. නමුත් සමහරක් අය අඳින්නේ ඉරුණු කබායක්. මෙතනත් එසේමයි. අන්න ඒ නිසා තමයි බාබා නැවත නැවතත් කියන්නේ දරුවනි, කිසිම දෙයක් සම්බන්ධයෙන් නොසැලකිලිමත් වන්න එපා. දිගටම ශ්‍රීමත් අනුගමනය කරන්න! දෙගුණයකින් උසස් වූ ශිව බාබා මගින් ඔබ උසස් බවට පත්වෙනවා. පියාගෙන් ඔබ බොහෝ වාර ගණනාවකදි ඔබගේ උරුමය දිනාගෙන, එය බොහෝ වාර ගණනකදී නැති කර ගත්තා. කල්ප බාගයක් පුරාවට පවතින උපත් 21 ක උරුමයක් ඔබ ලබා ගන්නවා. කලප් බාගයකට එනම්, වසර 2500 කට ඔබ සතුට ලබනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඇතුලතිනුත් පිටතිනුත් අවංකව සිටින්න. ඔබගේ ඉගනීමෙන් කවදාවත් නොසැලකිලිමත් වෙන්න එපා. ගැටළු සහගත බුද්ධියකින් යුතුව ඉගෙනීම නතර කරන්න එපා. සේවයට බාධකයක් බවට පත් නොවන්න.
2. ශ්‍රීමත් අනුගමනය කරමින් හා අපගේ ශරිරයෙන්, මනසින් හා ධනයෙන් උදව් කරමින් පාරිශුද්ධත්වයේ බලයෙන් සේවය කර භාරතය උපත් 21 කට උසස් හා කිරුළු දෙකක් පැළඳි එකක් බවට පත් කරවනවා යන සුබ ආරංචිය සියලු දෙනාටම පවසන්න.

**වරදානය:** ඔබ මාස්ටර් ගුරුවරයෙකු වී ඔබගේ පුණ්‍ය ගිණුමට නිරන්තරයෙන් එක් රැස් කර ගනිමින් අන් අයටද එසේ කිරීමට හැකියාව ලබා දෙත්වා.
"අපි මාස්ටර් ගුරුවරු". ඔබ "මාස්ටර්" යැයි පවසන විට, ඔබ ස්වයංක්‍රීයව පරමාත්ම පියා සිහිපත් කරයි. ඔබව නිර්මාණය කරන තැනැත්තා සිහිපත් කිරීමෙන්, ඔබ උපකරණයක් බව ස්වයංක්‍රීයව මතක් වේ. මෙම විශේෂ අවධානය නිරන්තරයෙන් තබා ගන්න : මම පුණ්‍ය ජීවාත්මයක් වන අතර අන් අයට ඔවුන්ගේ පුණ්‍ය ගිණුම් වලට රැස් කර ගැනීමට හැකියාව ලබා දෙමි! මෙය විශේෂ සේවාවකි. පුණ්‍ය ජීවාත්මයකට තම ගිණුමේ පච්කාර සිතුවිලි වලින් සියයට එකක්වත් තිබිය නොහැක. මාස්ටර් ගුරුවරයෙකු යනු තම පුණ්‍ය ගිණුමේ රැස් කර ගන්නා අතර පරමාත්ම පියා මෙන් අන් අයටද එය කිරීමට හැකියාව ලබා දෙන අයෙකි.

**පාඨය:** සමූහයක වැදගත්කම දන්නා කෙනෙකු සමූහයකදි තමාට ලැබෙන ආරක්ෂාව අත්විඳියි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

යමෙකුගේ බුද්ධියට ශ්‍රද්ධා විශ්වාසය ඇති තාක් දුරට, ඔහුට සියල්ල ජයග්‍රාහී වනු ඇත. බුද්ධියෙ ශ්‍රද්ධා විශ්වාසය ඇති කෙනෙකු කිසි විටෙකත් පරාජය කළ නොහැක. පරාජයක් තිබේ නම්, විශ්වාසයක් නොමැති බව ඔබට තේරුම් ගත හැකිය. බුද්ධියෙ ශ්‍රද්ධා විශ්වාසය ඇති සියලු ජයග්‍රාහී මැණික් වලින් ඔබ එක් මැණිකක් ලෙස සලකන්න. යම් බාධාවක් පැමිණි විට, එය විභාග ප්‍රශ්න පත්‍රයක් ලෙස සලකා සමත් වෙන්න. එම සිදුවීම දෙස නොබලන්න , එය ප්‍රශ්න පත්‍රයක් ලෙසම සලකා සමත් වෙන්න.